# යහපත් කෘෂි පිළිවෙත් අනුව කෙසෙල් වගා කරමු

## වගාකරුවන් සඳහා මාර්ගෝපදේශ අත්පොත




කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
2025

සම්පූර්ණ ප්‍රකාශනය බාගත කිරීමට
QR කේතය scan කරන්න.

# SL-GAP සහතිකකරණය සඳහා යහපත් කෘෂි පිළිවෙත් (GAP) අනුව කෙසෙල් වගා කරමු

SL-GAP සහතිකකරණ අංශය, බීජ සහතික කිරීමේ සේවය,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගන්නොරුව, පේරාදෙණිය.
2025

# SL-GAP සහතිකකරණය සඳහා යහපත් කෘෂි පිළිවෙත් (GAP) අනුව කෙසෙල් වගා කරමු

ISBN :

රචනය සහ සංස්කරණය

ආචාර්ය එච්. ආර්. යූ. ටී. එරබදුපිටිය

නියෝජ්‍ය අධ්‍යක්ෂ (SL-GAP සහතිකකරණය)

අංශ ප්‍රධානී, SL-GAP සහතිකකරණ අංශය

බීජ සහතිකකිරීමේ සේවය

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

ප්‍රකාශන දායකත්වය

UNIDO under the BESPA-FOOD Project,
with the assistance of the European Union

# හැඳින්වීම

ශ්‍රී ලංකාව තුල පළතුරක් ලෙස කෙසෙල් සඳහා ඉහල ඉල්ලුමක් ඇති අතර විශාල ලෙස වගාකිරීමද සිදුවේ. තවද, මෑතක සිට කෙසෙල් අපනයනය කිරීමටද කටයුතු කරන බැවින්,  සෞඛ්‍ය ආරක්ෂිත, ගුණාත්මක කෙසෙල් වගාවක්, පරිසර හිතකාමී ලෙස හා ආර්ථිකවත්ව සිදුකිරීම අත්‍යාවශ්‍යවේ. ඒ සඳහා යහපත් කෘෂිකාර්මික පිළිවෙත් වලට අනුකූල වන පරිදි කෙසෙල් නිෂ්පාදනය කිරීම මූලික පියවර ලෙස ගැනෙන අතර ඊට අදාලවන ප්‍රමිතීන් හඳුන්වාදීම අවශ්‍යවේ. ඒ සඳහා එළවළු හා පලතුරු වගාව පිළිබඳ ශ්‍රී ලංකා යහපත් කෘෂිකාර්මික පිළිවෙත් ප්‍රමිතීන් අනුව සකස් කළ මෙම අත්පොත මහත් උපකාරයක් වනු ඇත. එමගින්, පාරිභෝගිකයාට උසස් ගුණාත්මයෙන් යුත් නැවුම්, සෞඛ්‍ය ආරක්ෂිත කෙසෙල් නිෂ්පාදනයක් ලබා දීමත් තිරසාර වගාවක් පවත්වා ගනිමින් පරිසරය හා වගාකරුවන් ආරක්ෂා කිරීමත් සිදුවනු ඇත.

ශ්‍රී ලංකා යහපත් කෘෂි පිළිවෙත් (SL-GAP) අනුව කෙසෙල් වගාව සිදුකිරීම සඳහා වන අවශ්‍යතා (ප්‍රමිතීන්) මෙහි සඳහන්කර ඇති බැවින් ගුණාත්මක හා සෞඛ්‍ය ආරක්ෂිතව කෙසෙල් වගාව සිදුකර වෙළඳපොළට යැවීම දක්වා අනුගමනය කළයුතු පියවර පිළිබඳව සැකෙවින් විස්තර කෙරෙන මෙම අත්පොත, මේ පිළිබඳව උනන්දුවක් දක්වන ක්ෂේත්‍ර නිලධාරීන් ගොවිමහතුන් මෙන්ම සියලු පාර්ශව කරුවන්ට, SL-GAP අනුව කෙසෙල් වගාව පිළිබඳ දැනුවත්වීම සඳහා මහඟු අත්වැලක්වනු ඇත.

## SL-GAP සහතිකකරණය මගින්

ගොවිපළක් සකස්කරන අවස්ථාවේ සිට අස්වනු නෙලා ගොවිපළෙන් පිටතට ගෙනයන තෙක් කාලය තුළ ගොවිපලේ සිදු කරනු ලබන සියළුම ක්‍රියාවන් යහපත් කෘෂි පිළිවෙත් අනුව සිදුකරන බවටත් ගුණාත්මය ඉහළ නංවමින් අඛණ්ඩව පවත්වාගෙන යන බවටත් සහතික කෙරේ.



## SL-GAP සහතිකකරණය මගින් පහත සඳහන් වාසි රැසක් හිමිවේ

- අහිතකර ක්ෂුද්‍ර ජීවීන්, කෘෂිරසායන හා බැරලෝහ අවශේෂ වලින් තොර සෞඛ්‍යාරක්ෂිත කෘෂි නිෂ්පාදන බවට තහවුරුවක් ලැබෙන අතර විශ්වාසනීයව පාරිභෝජනයට අවස්ථාව හිමිවේ.
- සෞඛ්‍යාරක්ෂිත හා ගුණාත්මක නිෂ්පාදන සඳහා වන නව දේශීය හා විදේශීය වෙළඳපොළ අවස්ථා තුළින් ආර්ථික වාසි අත්කර ගැනීමට හැකිවේ.
- අස්වනු අලෙවියේදී අවදානම හා අඩමානයකින් තොරව ස්ථාවර අදායම් මට්ටමක් පවත්වා ගැනීමට හැකිවේ.
- ගොවිපළ මනා කළමනාකරණය තුළ අනවශ්‍ය යෙදවුම් භාවිතය අඩු වීමෙන් නිෂ්පාදන පිරිවැය අවම කර ලාභය ඉහළ නංවාගත හැකිවීම සහ
- නිෂ්පාදනවල සෞඛ්‍ය ආරක්ෂිත බව තහවුරුවීම තුළින් අපනයනයන්හි දී නිෂ්පාදන ප්‍රතික්ෂේප වීම අවමවේ.
- මනා සම්පත් කළමනාකරණයක් තුළින් පාරිසරික හානි අවමවීම හා ක්‍රමවත් තිරසාර ගොවිපොළක් පවත්වා ගැනීමට හැකිවේ.
- වගා හිමිකරුවන්ගේ මෙන්ම සේවකයන්ගේ සුබසාධනය හා සෞඛ්‍ය ආරක්ෂාව ඉහළ නැංවීම තුළින් ඔවුන්ගේ යහ පැවැත්ම තහවුරුවේ.

### SL-GAP ප්‍රමිතියෙහි අවශ්‍යතා ප්‍රධාන අංශ හතරක් යටතේ දක්වා ඇත

1 ආහාරයේ ආරක්ෂිතතාවය

2 නිෂ්පාදනයේ ගුණාත්මය

3 පාරිසරික කළමණාකාරිත්වය

4 කම්කරුවන්ගේ සෞඛ්‍ය, ආරක්ෂාව හා සුභසාධනය



## SL-GAP සහතිකකරනය සඳහා කෙසෙල් වගාවක් සිදු කිරීමේදී සැලකිලිමත් විය යුතු ප්‍රධාන අංග

### 1. වගාව සඳහා සුදුසු ඉඩමක් තෝරා ගැනීම හා නඩත්තුව




**නියමිත සීමා මායිම් සහිත යහපත් වටපිටාවක බෝග වගාවට සුදුසු, වගා කිරීමට අවසරයක් සහිත භූමියක් තෝරා ගැනීම.**

- නව වගාව සඳහා තෝරාගත් ඉඩමේ වගාවට අහිතකර දූෂක ඇති දැයි දැනගැනීම සඳහා එම ඉඩම මින් පෙර භාවිතා කළේ කුමන කටයුතු සඳහා ද යන්න විමසා බැලීම.
- යාබද භූමි වල වගාවන් සහ ක්‍රියාකාරකම් මගින් ඇතිවිය හැකි බලපෑම් පිළිබඳ සොයා බැලීම.
- කෙසෙල් වගාව සඳහා සුදුසු පස හා දේශගුණික අවශ්‍යතා සහිත භූමියක් වීම.
- කිසියම් අවධානම් සහගත තත්ත්ව හඳුනාගත් විට එම තත්ව සුදුසු පරිදි කළමනාකරණය කිරීමෙන් පසු පමණක් වගා කටයුතු සඳහා යොදා ගැනීම කළහැකිය.



**ගොවිපළ සිතියම** - ගොවිපළෙහි පිහිටීම, එහි වපසරිය, ක්ෂේත්‍ර අංක/බෝග හා ඊට යාබද ඉඩම් වල සිදුකරනු ලබන ක්‍රියාකාරකම් ඇතුළත් සිතියමක් ගොවිපළෙහි තිබිය යුතුය.

දළ බෑවුම් සහිත භූමි වල වගා ස්ථාපනය නොකළ යුතු අතර අවසර දියහැකි මට්ටමේ බෑවුම් සහිත ඉඩමක ගොවිපළ පිහිටා ඇති විට පාංශු ඛාදනය වැළැක්වීම සඳහා සුදුසු පාංශු සංරක්ෂණ ක්‍රම භාවිතා කළයුතුය.



GAP ගොවිපළ වටා ආරක්ෂිත වැටක් තිබීම අවශ්‍ය වේ.

## 2. රෝපණ ද්‍රව්‍ය

### උසස් ගුණාත්මයෙන් යුත් රෝපණ ද්‍රව්‍ය භාවිතා කිරීම

කෙසෙල් වගාවක් පිහිටුවන විට වඩාත්ම සුදුසු වන්නේ ශක්තිමත්, නිරෝගී, අළුතින්ම ගලවා ගත් මොරෙයියන් භාවිතා කිරීමයි.

කෙසෙල් වගාවක දී භාවිතා කළ හැකි රෝපන ද්‍රව්‍ය ප්‍රධාන වශයෙන් ආකාර 03 කි.

01. කඩුපත් මොරෙයියන්

02. කන්‍යා මොරෙයියන්

03. පටක රෝපිත පැළ

සිටුවීමට සුදුසු පටක රෝපිත පැළයක ලක්ෂණ

- වෛරස්වලින් තොරවීම. (ප්‍රධානවම කෙසෙල් වඳ පීදීමේ රෝග කාරකය)
- පැළයෙහි උස 25 cm ක් 30 cm ක් වීම.
- නිරෝගී කෙසෙල් පත්‍ර 4 ක් හෝ 5 ක් තිබීම.
- හොඳින් වර්ධනය වූ මූල පද්ධතිය.
- පළිබෝධකයින්ගෙන් හා රෝග වාහකයින්ගෙන් තොරවීම.



### අවශ්‍යතාවය අනුව සුදුසු ප්‍රභේද තෝරාගැනීම.

වගුව 1. එක් එක් කෘෂි දේශගුණික කලාපයන් සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් නිර්දේශ කර ඇති කෙසෙල් වර්ග.

| | පලතුරක් ලෙස | ව්‍යංජනයක් ලෙස |
|---|---|---|
| වියලි කලාපය | කෝලිකුට්ටු, ඇඹුල්, සීනි කෙසෙල්, කණ්ඩුල | අළු කෙසෙල්, මෝන්දන් වර්ග, ඇටමුරු වර්ග, පුලතිසි, කණ්ඩුල |
| අතරමැදි කලාපය | කෝලිකුට්ටු, ඇඹුල්, සීනි කෙසෙල්, ආනමාළු, ඇම්බන්, කණ්ඩුල | අළු කෙසෙල්, මෝන්දන් වර්ග, ඇටමුරු වර්ග, කිතල, පුලතිසි, කණ්ඩුල |
| තෙත් කලාපය | ඇඹුල්, සීනි කෙසෙල්, පූවාලු, ආනමාළු, ඇම්බන්, බිම් කෙසෙල්, සුවඳැල්, නේත්‍රම්පලං, රත් කෙසෙල්, කණ්ඩුල | මෝන්දන් වර්ග, ඇටමුරු වර්ග, කිතල, පුලතිසි, කණ්ඩුල |

## පැළ සිටුවීමට සූදානම් කිරීම.

මව් ශාකයෙන් ලබා ගන්නා පැළ උදුරා ගත් වහාම එනම් හැකි පමණ ඉක්මනින් සිටුවීම ඉතා සුදුසුය. එවිට සාර්ථකත්වය වැඩිය.

මව් ශාකයෙන් ගලවාගත් පැළ ප්‍රතිකාරකර සිටුවීම තුළින් යම් කෘමි හානි වළක්වා ගත හැකිය. ඒ සඳහා, පැළ වල මුල් සහ පත්‍ර කපා ඉවත් නොකර, එම පැළ වල ඉතා දික් වූ මුල් ඇත්නම් ඒවා කෙටි කර කපා, පැළයේ අලය ඇති කොටස පමණක් නටන උණු ජලයෙහි තත්පර 30 (විනාඩි 1/2) ගිල්වා ඉවතට ගෙන සිටුවීම වැදගත්ය.

මෙහිදී, කෙසෙල් ගුල්ලාගේ ජීවන චක්‍රයේ සියළුම අවස්ථාවන් ද, වටපණුවන් සිටී නම් එම වටපණුවන් ද විනාශ වේ.

## පැළ අතර පරතරය හා ක්ෂේත්‍රයේ පිහිටුවීම



වගා කිරීමේ පරතරය - වගා කරනු ලබන කෙසෙල් ප්‍රභේදය, පසේ සාරවත්භාවය සහ වගාව පවත්වා ගැනීමට බලාපොරොත්තු වන කාල සීමාව අනුව වගා කරන පරතරය වෙනස් වේ.

වගාව පවත්වා ගන්නා කාල සීමාව අනුව ප්‍රධාන ක්‍රම 02 කි.

01. බහු වාර්ෂික ක්‍රමයට වගා කිරීම

02. වාර්ෂික ක්‍රමයට වගා කිරීම

### 01. බහු වාර්ෂික ක්‍රමයට වගා කිරීම

මෙහිදී සාම්ප්‍රදායික ක්‍රමයට පැළ සිටුවා පඳුරක් ආකාරයට නඩත්තු කර වසර 5 ක් හෝ ඊට වැඩි කාලයක් පවත්වා ගනී.

වගුව 2. බහු වාර්ෂික වගාවක් ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය පරතරයන්

| ප්‍රභේදය | පරතරය (අඩි) | අක්කරයට අවශ්‍ය පැළ ගණන |
|---|---|---|
| කෝලිකුට්ටු, බිම් කෙසෙල් | 8 x 8 | 703 |
| ආනමාළු, ඇඹුන් | 12 x 12 | 312 |
| ඇඹුල් සහ අනෙකුත් වර්ග | 10 x 10 | 450 |

### 02. වාර්ෂික ක්‍රමයට වගා කිරීම


මෙම වගා ක්‍රමය යටතේ කෙසෙල් වගා කළවිට බහුවාර්ෂික ක්‍රමයට වඩා තුන් ගුණයකින් පමණ අස්වැන්න හා ආදායම වැඩිකර ගත හැක. එය මෙම ක්‍රමයේ ඇති විශේෂත්වයයි. මෙයට අමතරව වගාවට සපයන ජලය ද වඩා කාර්යක්ෂමව ප්‍රයෝජනයට ගැනීමට ද කෙසෙල් වගාවේ ගැටලුවක්ව පවතින පැනමා වැනි දරුණු දිලීර රෝග ව්‍යාප්ත වීම අඩු කර ගැනීමට ද මෙම ක්‍රමයෙන් හැකි වේ.

වගුව 3. වාර්ෂික වගාවක් ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය පරතරයන්

| ප්‍රභේදය | පරතරය (අඩි) | අක්කරයට අවශ්‍ය පැළ ගණන |
|---|---|---|
| කෝලිකුට්ටු, අඵ කෙසෙල් | 4 x 3 | 1618 |
| ආනමාඵ, ඇම්බන් | 10 x5 | 1349 |
| ඇඹුල් | 10 x3 | 450 |

### පැළ සිටුවීමේදී

- පැළ සිටුවීමට සති දෙකකට පමණ පෙර හොඳින් දිරාපත්වූ කාබනික පොහොර මතුපිට පස් සමග හොඳින් මිශ්‍ර කර එයින් වළ පුරවන්න.



තවද තෙත් කලාපයේදී වළකට ඩොලමයිට් ග්‍රෑම් 500 ක් බැගින් යොදන්න.

- පැළ සිටුවීමට දින දෙකකට පෙර නිර්දේශිත මූලික රසායනික පොහොර මිශ්‍රණය නිර්දේශිත ප්‍රමාණයෙන් වළේ පස් වලට මිශ්‍ර කරන්න.
- මොරෙයියාගේ අලය කොටස පමණක් පසට යටවනසේ වළවල්වල මැදින් සිටුවන්න.

## වෙනත් ක්ෂේත්‍ර කටයුතු

### කැන් ආවරණය කිරීම

- කැන් ආවරණය කිරීම තුළින් උසස් ප්‍රමිතියෙන් යුත් ගෙඩි ලබා ගත හැක. එමගින් ගෙඩිවල විශාලත්වය වැඩිවීම, ප්‍රසන්න පෙනුමක් ලැබීම, ගෙඩි දුර්වර්ණවීම වැළැක්වීම සිදුවේ.
- සවිවර වූ බෑගයකින් කෙසෙල් කැන් ආවරණය කිරීම වඩාත් සුදුසුය (පොලිතීන් ආවරණවල සිදුරු කපා භාවිතා කළ හැකිය).
- කැන පීදී සති 2-4 කදී කැන් ආවරණය කිරීම කළ යුතුය.
- අපනයනය පිණිස වගා කරන විට කැන් ආවරණය අනිවාර්යයෙන් කළ යුතු ක්‍රියාවකි.

### ආධාරක සැපයීම

- කෙසෙල් කැන් මේරීමට පෙර කෙසෙල් ගස් කඩා වැටීම වැළැක්වීම සඳහා ශක්තිමත් ලී දඬු හෝ උණ බම්බු උපයෝගී කරගෙන ආධාරක සැපයීම සිදු කළ යුතු වේ.
- කෙසෙල් කැනෙහි වහල්ල කඳට සවිවන ස්ථානයට මෙම ආධාරකය සැපයීම වඩාත් සුදුසු වේ.

### කෙසෙල් මුහය ඉවත් කිරීම

- කෙසෙල් ගස පීදී, කැනෙහි ඇවරි සියල්ල ඇති වූ පසු මුහය ඉවත් කරන්න.
- කෙසෙල් කැනෙහි අවසාන ඇවරියේ සිට සෙ.මී. 7.5 - 10 (අඟල් 3-4 ක්) පමණ පහතින් නටුව ඉතිරි වන සේ මුහය ඉවත් කිරීම වඩා සුදුසුය.

## 3. පොහොර යෙදීම

- **ඒකාබද්ධ පෝෂණ කළමණාකරණය අනුගමනය කිරීම,** එනම් රසායනික මෙන්ම කාබනික පොහොර ශාකයට අවශ්‍ය අවස්ථාවේදී අවශ්‍ය ප්‍රමාණයට සුදුසු ක්‍රමවේදයකට ලබාදීම.
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ වෙනත් සුදුසු පාංශු පරීක්ෂණ සේවාවකින් පස් පරීක්‍ෂා කර නිර්දේශ අනුව රසායනික පොහොර යෙදීම.
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශිත පොහොර නිර්දේශය (හෝ භාවිතා කරනු ලබන පොහොර නිර්දේශය) ලිඛිතව සටහන් කර තිබිය යුතු අතර වෙනසක් වේ නම් එයද සටහන් කර ක්‍රියාත්මක කර තිබීම.
- පොහොර හෝ පසට එකතු කරන වෙනත් ද්‍රව්‍ය නිසා නිෂ්පාදන දූෂණය විය හැකි බවට හඳුනා ගතහොත් එම අවදානම අවම කිරීම සඳහා ක්‍රියා කළ යුතුය.
- බැර ලෝහ මගින් නිෂ්පාදන දූෂණය වීමේ අවදානම අවම වන පරිදි පොහොර හා පසට එකතු කරන වෙනත් ද්‍රව්‍ය තෝරා ගැනීමට කටයුතු කරන්න. විශේෂයෙන් ඒ සඳහා පොහොර ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කළ රසායන පොහොර භාවිතා කිරීම වැදගත්.



**පත්‍ර මතට හා පසට/මූල මණ්ඩලයට යොදනු ලබන සියලුම පොහොර සහ හෝමෝන ආදී සියලු යෙදීම් පිළිබඳ වාර්තා සටහන් කිරීම කල යුතුය.**

### රසායනික පොහොර යෙදීම

රසායනික පොහොර යෙදීම දේශගුණික කලාපය, ජල සම්පාදන ක්‍රමය හා වගා ක්‍රමය අනුව වෙනස් වේ.

වගුව 4. තෙත් කලාපය සඳහා බහු වාර්ෂික ක්‍රමයට කෙසෙල් වගා කිරීමේදී යෙදිය යුතු පොහොර නිර්දේශය (පැළයකට යෙදිය යුතු ප්‍රමාණය (ග්‍රෑම්))

| යොදන අවස්ථාව | යූරියා | එම්.ඕ.පී. | ටී.එස්. පී. | කීසරයිට් |
|---|---|---|---|---|
| මූලික පොහොර (සිටුවීමට දින 1-2ට පෙර) | 55 | 95 | 50 | - |
| සිටුවා මාස 2ට පසු | 110 | 190 | 100 | 100 |
| සෑම මාස 4ට වරක් | 110 | 190 | 100 | 100 |

වගුව 5. තෙත් කලාපය සඳහා වාර්ෂික ක්‍රමයට කෙසෙල් වගා කිරීමේදී යෙදිය යුතු පොහොර නිර්දේශය (පැළයකට යෙදිය යුතු ප්‍රමාණය (ග්‍රෑම්))

| කාලය | යූරියා | එම්.ඕ.පී. | ටී.එස්. පී. | කීසරයිට් |
|---|---|---|---|---|
| මූලික පොහොර (සිටුවීමට දින 1-2ට පෙර) | 30 | 150 | 80 | - |
| සිටුවා මාස 2ට පසු | 60 | 250 | 40 | 100 |
| සිටුවා මාස 4ට පසු | 150 | 250 | | 100 |
| සිටුවා මාස 8-9ට පසු | 150 | 250 | | 100 |

වගුව 6. වියලි හා අතරමැදි කලාපය සඳහා ජල සම්පාදන තත්වයටතේ බහුවාර්ෂික ක්‍රමයට කෙසෙල් වගා කිරීමේදී යෙදිය යුතු පොහොර නිර්දේශය (පැළයකට යෙදිය යුතු ප්‍රමාණය (ග්‍රෑම්))

| යොදන අවස්ථාව | යූරියා | එම්.ඕ.පී. | ටී.එස්. පී. |
|---|---|---|---|
| මූලික පොහොර (සිටුවීමට දින 1-2ට පෙර) | 30 | 125 | 40 |
| සිටුවා මාස 2ට පසු | 120 | 250 | 80 |
| සිටුවා මාස 4ට වරක් | 120 | 250 | 80 |

වගුව 7. වියලි හා අතරමැදි කලාපය සඳහා ජල සම්පාදන තත්වයටතේ බහුවාර්ෂික ක්‍රමයට කෙසෙල් වගා කිරීමේදී යෙදිය යුතු පොහොර නිර්දේශය (පැළයකට යෙදිය යුතු ප්‍රමාණය (ග්‍රෑම්))

| යොදන අවස්ථාව | යූරියා | එම්.ඕ.පී. | ටී.එස්. පී. |
|---|---|---|---|
| මූලික පොහොර (සිටුවීමට දින 1-2ට පෙර) | 60 | 125 | 40 |
| සිටුවා මාස 2ට පසු | 120 | 250 | 80 |
| සිටුවා මාස 6ට වරක් | 180 | 375 | 120 |

වගුව 8. වියලි හා අතරමැදි කලාපය සඳහා ජල සම්පාදන තත්වයටතේ වාර්ෂික ක්‍රමයට කෙසෙල් වගා කිරීමේදී යෙදිය යුතු පොහොර නිර්දේශය (පැළයකට යෙදිය යුතු ප්‍රමාණය (ග්‍රෑම්))

| යොදන අවස්ථාව | යූරියා | එම්.ඕ.පී. | ටී.එස්. පී. |
|---|---|---|---|
| මූලික පොහොර (සිටුවීමට දින 1-2ට පෙර) | 30 | 150 | 80 |
| සිටුවා මාස 2ට පසු | 60 | 250 | 40 |
| සිටුවා මාස 4ට පසු | 150 | 250 | |
| සිටුවා මාස 8-9ට පසු | 150 | 250 | |

යොදන රසායනික, කාබනික හා වෙනත් ඕනෑම පොහොර වර්ගයක් පිළිබඳ විස්තර සටහන්කර තබා ගැනීම ඉතා වැදගත් වේ.



**පසේ pH අගය 5 ට වඩා අඩුනම් තෙත් කළාපීය ප්‍රදේශවල පමණක් පැල සිටුවීමට සතිදෙකකට පෙර වළක් සඳහා ඩොලමයිට් ග්‍රෑම් 500ක් යෙදීම නිර්දේශ කර ඇත.**

**පොහොර ගබඩා කිරීම**


- පොහොර වර්ග වල ගුණාත්මයට හානි නොවන පරිදි හොඳින් ආවරණය වු පිරිසිදු වියළි ස්ථානයක ගබඩා කිරීම.
- පොහොර ඇසුරුම් කර ඇති මළු සෘජුවම පොළොව සමග ස්පර්ශ නොවන සේ තැබීම.
- භාවිතා කරන ලද පොහොර මළු කැන් ආවරණය සඳහා හෝ ආහාර මය ද්‍රව්‍ය ගබඩා කිරීමට, නැවත භාවිතා නොකලයුතු අතර ආහාර ද්‍රව්‍ය සමඟ ස්පර්ශ වන සේ තැබීමද සිදු නොකල යුතුය.

### කාබනික පොහොර



- ගුණාත්මය තහවුරුකළ හොඳින් දිරූ කාබනික පොහොර කි.ග්‍රෑම් 10ක් එක් වලකට මිශ්‍ර කිරීම වැදගත් වේ.
- ගොවිපළට බැහැරින් කාබනික පොහොර ලබා ගන්නේ නම්, එහි ප්‍රභවය පිළිබඳ වාර්තා තබා තබාගැනීම වැදගත් වේ.
- කෙසෙල් නිෂ්පාදනය කිරීමේදී යොදා ගන්නා පොහොර සඳහා මිනිස් මළ ද්‍රව්‍ය මිශ්‍ර නොවිය යුතුය.
- නිෂ්පාදන භූමි, පසු අස්වනු සැකසුම් හා ඇසුරුම් ප්‍රදේශ හා ජල මූලාශ්‍ර දූෂ්‍යවීමේ අවදානම අවම වන සේ කාබනික පොහොර සැකසීම හා ගබඩා කිරීම සිදුකළ යුතුය.

### 4. ජල සම්පාදනය



- ජල සම්පාදනය සඳහා යොදාගන්නා ජලය වගාවට සුදුසු තත්ත්වයේ තිබිය යුතුය.
- යොදා ගන්නා ජල ප්‍රභවය රසායනික හෝ ජෛවීය දූෂක මගින් දූෂ්‍යවීමේ අවදානම අවම කර ආරක්ෂාකාරීව පවත්වා ගැනීමට අවශ්‍ය පියවර ගැනීම.
- පසු අස්වනු කටයුතු වලදී, පානයට සුදුසු ගුණාත්මයෙන්යුතු ජලය භාවිතා කිරීම.
- වියළි කාල වලදී ජලසම්පාදනය කළ හැකිනම් කැන් වල විශාලත්වය හා ගෙඩි වල ප්‍රමාණය වැඩි කර ගත හැකිය. ජල සම්පාදන කාලාන්තරය පසේ ස්වභාවය මත හා වාර්ෂික වර්ෂාපතනය මත රඳා පවතී.

## 5. බෝග ආරක්ෂා කිරීම



බෝග ආරක්ෂා කිරීම පිණිස පළිබෝධනාශක භාවිතය අවම කර හැකි සෑම අවස්ථාවකදීම පිළිගත් ඒකාබද්ධ පළිබෝධ පාලන ක්‍රම භාවිතා කර තිබිය යුතුය.

### කසෙල් වගාවේ ප්‍රධාන කෘමි පාලනය

1. කෙසෙල් ගුල්ලාගේ හානිය

රෛසෝමයට හානි කරන අල ගුල්ලා සහ කඳට හානි කරන කඳ ගුල්ලා ලෙසට ආකාර දෙකකි.



සුහුඹුල් අල ගුල්ලා



අල ගුල්ලාගේ හානිය



සුහුඹුල් කඳ ගුල්ලා



කඳ ගුල්ලාගේ හානිය

### පාලන ක්‍රියා

- නිරෝගී අල පමණක් සිටුවීම සඳහා භාවිතා කිරීම.
- පැළ සිටුවීමට පෙර නිර්දේශිත ප්‍රතිකාර ක්‍රම යොදා ගැනීම
- කෙසෙල් කැන කපාගත් පසුව ගසේ කඳ පස මට්ටමට මදක් පහළින් කපා ඉවත් කර, එම ස්ථානය පස් වලින් වසා දමන්න.
- වගාවේ කෙසෙල් ගුල්ලාගේ හානිය සැලකිය යුතු පමණින් ඇති බව තහවුරු කර ගැනීමෙන් පසුව පමණක් රසායනික පාලන ක්‍රම අනුගමනය කරන්න.

**2. කෙසෙල් පැළ මැක්කා**

කෙසෙල් කැනෙහි ඇවරි බේරීම ආරම්භ වූ වහාම කැන් ආවරණය කිරීමෙන් මෙම කෘමි හානිය වළක්වා ගත හැකිය.

## කෙසෙල් වගාවේ ප්‍රධාන රෝග

**1. පැනමා රෝගය/ ෆියුසේරියම් මැලවීම**

පාලන ක්‍රියාඃ

- රෝගී වගාවකින් රෝපණ ද්‍රව්‍ය නොගැනීම.
- වගාවේ ජලවහනය දියුණු කිරීම.
- රෝගී පඳුරු හැකි ඉක්මනින් ගලවා පස් සමඟ ඉවත් කිරීම.
- රෝගයට ඔරොත්තු දෙන ප්‍රභේද වගා කිරීම (ඇඹුල් ප්‍රභේදය මෙම රෝගය සඳහා ඔරොත්තු දේ).
- රෝගී වගාවක සිට පිටතට එන විට හැකි සෑම අවස්ථාවකදීම දෙපා විෂබීජනාශනය කර ගැනීම තුළින් දිලීර බීජාණු පැතිරීම වැළැක්වීම.
- රෝගයට පාත්‍රවන ප්‍රභේද, තනි වගාවක් ලෙස නොව ඔරොත්තු දෙන ඇඹුල් ප්‍රභේදය සමඟ මිශ්‍රව වගා කිරීම

**2. වඳ පීදීම**

වඳ පීදීමේ වෛරසය නිසා මෙම රෝගය හට ගනී

## රෝග පාලන ක්‍රියා

- රෝගී ශාක වලට නිර්දේශිත කෘමි නාශකයක් යෙදීමෙන් එහි සිටින කුඩිත්තන් විනාශ කරන්න.
- හැකි ඉක්මණින් රෝගී ගස් ඉවත් කර පුළුස්සා දැමීමට පියවර ගන්න.
- නිරෝගී රෝපණ ද්‍රව්‍ය භාවිතා කරන්න.
- රෝගී පඳුරු වලින් සිටුවීම සඳහා පැළ ලබා නොගන්න.

- පටක රෝපණයෙන් පැළ ලබා ගන්නේ නම්, මව් ශාක වෛරස් හඳුනා ගැනීමේ පරීක්ෂණයකින් වෛරස් නොමැති බවට තහවුරු කරන්න

- ආසාදිත ශාක මුල් අවධියේදීම නිවැරදිව හඳුනාගෙන වගාවෙන් ඉවත් කිරීමට පියවර ගන්න. නැවත වරක් නිරෝගී පැළ ආසාදනය වීම වැළැක්වීමට එම ස්ථානයේ පස පුළුස්සා දමන්න.

- වගා ක්ෂේත්‍රය හා පරිශ්‍රයන් මනා සනීපාරක්ෂාවකින් යුතුව කැලි කසල වලින් තොරව ඉතා හොඳින් පවත්වා ගැනීම.

## බෝග ආරක්ෂණය සඳහා පළිබෝධනාශක යෙදීම




- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් කෙසෙල් වගාවේ අදාල පළිබෝධකයා සඳහා නිර්දේශිත පළිබෝධනාශක පමණක් භාවිතා කිරීම.

- පළිබෝධනාශකවල මිනිසාට ඇති විෂ මට්ටම්වල තීව්‍රතාවය වැඩිම ඒවායේ සිට අඩුම ඒවා දක්වා හැඳින්වීමට පිළිවෙලින් රතු, කහ, නිල්, කොළ වර්ණ දාර පළිබෝධනාශක ලේබල් මත පහළින් ඇතුළත් කර ඇත. ඒ අනුව ප්‍රායෝගිකව හැකි සෑම අවස්ථාවකම අඩුම විෂ සහිත පළිබෝධනාශක බෝගවලට යෙදීම සඳහා තෝරා ගත යුතුය.

- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පළිබෝධනාශක පාලන පනත යටතේ ලියාපදිංචි කල පළිබෝධනාශක පමණක් නිර්දේශිත ප්‍රමාණවලින් යෙදීම සුදුසුය

## පළිබෝධනාශක යෙදීම් සම්බන්ධ වාර්තා

- පළිබෝධනාශක යෙදීම් සම්බන්ධ වාර්තා සඳහා, යෙදීම් සිදු කරන දිනයන්, යෙදීමට හේතුව, භාවිතා කළ පළිබෝධනාශකයේ නම, යෙදූ මාත්‍රාව, යෙදූ ක්‍රමය හා යෙදූ තැනැත්තා ආදී තොරතුරු ඇතුලත්ව සටහන් තබා ගැනීම.

## පළිබෝධනාශක යෙදීමේදී ආරක්ෂාව, පුහුණුව හා උපදෙස්



- පළිබෝධනාශක යෙදීම සඳහා විසිරුම් (Spray) උපකරණ ක්‍රියාකරවන්නන් පිළිගත් පුහුණුකරුවන් වෙතින් සුදුසු පුහුණුවක් ලබා තිබීම.
- පළිබෝධනාශක භාවිතයේ දී ලේබලයේ සඳහන් නිර්දේශ පිළිපැදීම.
- පළිබෝධනාශක වර්ග දෙකක් හෝ කිහිපයක් එකට මිශ්‍ර නොකිරීම.
- මිශ්‍රණ සැකසීම සඳහා පිරිසිදු ජලය භාවිතා කිරීම.

## පළිබෝධනාශක ගබඩා කිරීම



- ලේබලයට හානි නොකොට පළිබෝධනාශක ඒවායේ මුල් ඇසුරුමින්ම ගබඩා කිරීම.
- ආරක්ෂිත, හොඳින් වාත්‍රාශය හා ආලෝකය ලැබෙන ස්ථානයක අගුලු දැමිය හැකි ආකාරයට සැකසූ පළිබෝධනාශක ගබඩාවක් තුළ ගබඩා කිරීම.
- කුඩු ලෙස පවතින සම්මිශ්‍රණ, ද්‍රවමය සම්මිශ්‍රණ සහිත රාක්ක වලට ඉහලින් හෝ වෙනම ගබඩා කිරීම.

## හිස් පළිබෝධනාශක බඳුන්



- පළිබෝධනාශක අවසන්වූ බඳුන් තෙවරක් ජලයෙන් සෝදා එම ජලයද පළිබෝධනාශක මිශ්‍රණ සඳහා යොදා ගැනීම.
- සිදුරු කිරීම/තැලීම හෝ කිසිසේත් ගිනි තැබීම සිදු නොකර අපහරනය කරන තුරු ආරක්ෂිතව තැබීම (බෑගයක දමා ගැටගසා තැබීම හෝ හිස් බැරලයකට දමා වසා තැබීම වැනි).

### ආරක්ෂිත ඇඳුම් කට්ටලය හා ආම්පන්න



- පළිබෝධනාශක යෙදීමේ දී සෞඛ්‍යට බලපාන අනතුරු හා ආරක්ෂාව සඳහා සුදුසු ආරක්ෂිත ඇඳුම් කට්ටලයකින් හා ආම්පන්නවලින් ක්‍රියාකරුවන් සමන්විත වීම.
- පුද්ගල ආරක්ෂිත ඇඳුම් පැලඳුම් හා ආම්පන්න භාවිතයෙන් පසු පිරිසිදු කොට, පළිබෝධනාශක වලින් ඈත්ව වෙනම ගබඩා කිරීම.

### 6. අස්වනු නෙලීම හා පරිහරණය

- නියමිත පරිනතියේදී අස්වනු නෙලීම වැදගත්වේ.
- ගෙඩි තුවාල නොවන පරිදි අස්වනු නෙලා ගැනීම ඉතාවැදගත් වේ.
- අස්වනු නෙලන අවස්ථාව එනම් කෙසෙල් කැනක් හටගත් දිනයේ සිට සුදුසු තත්වයට මේරීමට ගතවන කාලය වගා කරන ප්‍රභේදය අනුව වෙනස්වන අයුරු පහතින් දක්වා ඇත.

වගුව 9. වගා කරන ප්‍රභේදය හා මේරීමට ගතවන කාලය

| කෙසෙල් වර්ගය/ප්‍රභේදය | මේරීමට ගතවන කාලය |
|---|---|
| ආනමාලු හා ඇම්බන් | මාස 3 |
| ඇඹුල් | මාස 3 සති 1 |
| කෝලිකුට්ටු | මාස 4 |
| සීනි කෙසෙල් | මාස 4 සති 2 |
| පූවාලු | මාස 5 |

පවතින කාලගුණික තත්ත්ව අනුව ඉහත කාල සීමාවන් සුළු වශයෙන් වෙනස්විය හැක.

වගුව 10. කෙසෙල් වර්ගය අනුව ලබාගත හැකි අස්වනු ප්‍රමාණ

| කෙසෙල් වර්ගය/ | සාමාන්‍ය පාලන තත්ත්ව යටතේදී (කි.ග්‍රෑ.) | උසස් පාලන තත්ත්ව යටතේ දී (කි.ග්‍රෑ.) |
|---|---|---|
| ඇඹුල් | 15 | 20-22 |
| ඇම්බන් | 18 | 25-30 |
| ආනමාළු | 15 | 20-25 |
| අළු කෙසෙල් | 12 | 15-18 |
| සීනි කෙසෙල් | 16 | 20-22 |

- කෙසෙල් කැන් කෙලින්ම පස් සමග නොගැටෙන සේ තබන්න. අස්වැන්න හැසිරවීමේදී, ඇසිරීමේදී, තාවකාලිකව ගබඩා කර තැබීමේදී පොළව සමග ස්පර්ශ වීමෙන් වලක්වා ගැනීම අවශ්‍ය වේ.
- බෝග නිෂ්පාදන හැසිරවීම, තේරීම, ඇසිරීම හා ගබඩා කර තබන ස්ථාන හා ඒ අවට ප්‍රදේශ පළිබෝධ වලින් තොරව පවත්වා ගැනීමට කටයුතු කිරීම වැදගත්වේ

## අනුරේඛනය

නිෂ්පාදන කුමන ගොවිපලෙන් හා කුමන කොටසකින් නිෂ්පාදනය කරන ලද්දක් දැයි පසු විපරම්කර බැලීමට හැකි වීම අනුරේඛනය මඟින් බලාපොරොත්තු වේ.

ඒ සඳහා ගොවිපලේ සෑම කෙසෙල් නිෂ්පාදන ක්ෂේත්‍රයක්ම නමකින්, සංකේතයකින්, අංකයකින් හැඳින්වීමට කටයුතු කරන්න. මෙම නම් හෝ සංකේත ගොවිපලේ පිහිටීම් සිතියමේ සටහන් කරන අතර එක් එක් නිෂ්පාදන ඒකකයක් තුළ ද එහි නම, සංකේතය හෝ අංකය ප්‍රදර්ශනය කිරීමට කටයුතු කළ හැකිය.

## ගබඩා කිරීමේදී

වඩා සුදුසු අවස්ථාවේදී අස්වනු නෙලාගත් විට කාමර උෂ්ණත්වය යටතේ දින 7-8 පමණ කාලයක් කොළ පැහැති තත්ත්වයෙන්ම තබා ගත හැකිය.


උෂ්ණත්වය 12°C - 13°C හා සාපේක්ෂ ආර්ද්‍රතාවය 80-85% සහිත ශීත කාමරවල දින 30 පමණ කාලයක් ගබඩා කළ හැක.

### ප්‍රවාහනය කිරීම

යාන්ත්‍රික හානි අවම කිරීම සඳහා කෙසෙල් අසුරන ලද භාජන ආරක්ෂාකාරීව ප්‍රවාහනය කිරීම අවශ්‍ය වේ.

### කෙසෙල් ඉදවීම

- දේශීය තත්ත්ව යටතේ කෙසෙල් අස්වැන්න නෙලීමෙන් පසු, දින 3-4 කින් පමණ ස්වභාවිකව ඉදීම සිදු වෙයි.
- කෘත්‍රිමව ඉදවා ගැනීම සඳහා රසායනික ද්‍රව්‍ය (එත්‍රැල්) භාවිතා කරයි. ඒ සඳහා නිවැරදි නිර්දේශිත ක්‍රමවේදය පමණක් භාවිතා කළ හැකිය.
- එත්‍රැල් භාවිතා කර කෙසෙල් ඉදවීමේදී වායු හුවමාරුව සිදු නොවනසේ වැසිය හැකි හෝ ආවරණය කළ හැකි බඳුනක්, පෙට්ටියක් හෝ කාමරයක් තුළ එහි පරිමාවෙන් 1/5 ක නිදහස් අවකාශයක් තිබෙන ලෙස නියමිත පරිදි මේරූ කෙසෙල් ඇවරි හෝ කැන් ඇසිරීම සිදු කරන්න.




### ඉදවීමට භාවිතා කරන කුටීරය/ කාමරය සකස්කලයුතු අයුරු

- කුටීරයේ දොර හොඳින් වසා තබන්න. මෙම දොර වායු හුවමාරුව සිදුනොවන පරිදි වායුරෝධනය (seal) විය යුතුය.
- එමෙන්ම, පී.වී.සී. බටයකින් පිටත සිට කුටීරය තුළට හුණු දියර දැමීමට හැකිවන පරිදි ඇටවුමක් සකසා ගත යුතුය.

පහත ද්‍රාවණ දෙක වෙන වෙනම සාදා ගන්න

A). එත්‍රැල් ද්‍රාවණය සාදා ගැනීම

එත්‍රැල් මිලිලීටර 01 ක් ගෙන එය ජලය ලීටරයක දියකර එත්‍රැල් ද්‍රාවණය සාදා ගත යුතුය.

B). හුණු ද්‍රාවණය සාදා ගැනීම

දියගැසූ හුණු (Ca(OH)2 ග්‍රෑම් 10 ක් ජලය ලීටරයක දියකර හුණු ද්‍රාවණය සාදා ගත යුතුය.

- කාමරයේ/ කුටියේ පරිමාව ඝන අඩි 1 ක් සඳහා සාදාගත් එත්‍රැල් ද්‍රාවණයෙන් මිලි ලීටර 3-5 ක් වනසේ, කාමරයේ පරිමාවට අදාලව අවශ්‍ය එත්‍රැල් ප්‍රමාණය ගණනය කර ගත යුතුය.
- කුටීරයේ පරිමාව අනුව සාදාගත් එත්‍රැල් ද්‍රාවණය ප්ලාස්ටික් හෝ මැටි බඳුනක දමා කුටීරයේ කෙළවරක තබන්න.
- සාදාගත් හුණු දියර, දිය කරගත් එත්‍රැල් දමූ ප්‍රමාණයට සමාන ප්‍රමාණයක් පුනීලයක ආධාරයෙන් පී.වී.සී. බටයකට දැමීමෙන්, හුණු දියර එත්‍රැල් භාජනයට වැටීමට සලස්වන්න. ඉන්පසු හැකි ඉක්මනින් පී.වී.සී. බටයේ කට වසා තබන්න. (එන්ඩ් කැප් එකක් මඟින්).
- පැය 24 ක කාලයක් ඉහත පරිදි ආවරණය කර තබා, ඉන්පසු තවත් දින දෙකක් හොඳින් වාතාශ්‍රය ලැබෙන පරිදි කුටීරය නිරාවරණය කර තබන්න.
- එමඟින් හොඳින් ඉදුණු ගුණාත්මක කෙසෙල් ගෙඩි ලබා ගත හැකිය.

**පලතුරු කෘත්‍රිමව ඉදවීමේදී සැලකිය යුතු කරුණු**

- කිසිවිටෙකත් නොමේරූ පලතුරු භාවිතා නොකරන්න.
- එත්‍රැල් හා හුණු දියර වෙන වෙනම සාදා තබා ගත යුතුය. මිශ්‍ර කිරීම කළ යුතු වන්නේ ඉදවීමේ කුටීරය තුළ දී පමණි.
- කුටීරයේ දොර විවෘත කිරීම කළ යුත්තේ පැය 24 ක කාලයකට පසුවය. ඒ වන විට පලතුරු ඉදී නොමැති වුවද දොර ඇර නැවුම් වාතය ලැබීමට සලස්වන්න.
- කුටීරයෙන් එළියට ගත් විගස පලතුරු වෙළඳපොලට ප්‍රවාහනය කළ යුතුය.

### ලේබල් කිරීම හා සළකුණු කිරීම

- නිෂ්පාදන ගොවිපළ තුල ඇසුරුම් කරන්නේ නම්, ගොවිපළ හා ගොවිපළ නිෂ්පාදන පාරිභෝගිකයාට පහසුවෙන් හඳුනාගැනීම (අනුරේඛනය) සඳහා නිෂ්පාදන අඩංගු ලේබලයෙහි අදාල තොරතුරු, (GAP අංකය හා QR කේතය ඇතුලත්ව) පැහැදිලිව සඳහන් කිරීම.
- පසු අස්වනු ප්‍රතිකර්ම සඳහා රසායනික ද්‍රව්‍ය භාවිතය අවම කර තිබිය යුතුය. රසායනික ද්‍රව්‍ය භාවිතා කළේ නම්, නිෂ්පාදනයේ ලේබලය මත එය සටහන් කිරීම කලයුතුය

### 7. ලිපි ලේඛන අවශ්‍යතා



ගොවිපළ කටයුතු ආරම්භයේ සිට ගොවිපළ භූමියෙන් නිෂ්පාදන බෙදා හරින අවස්ථාව දක්වා අදාල ක්‍රියාකාරකම් බෝග වාර්තා පොතට අනුව වාර්තා කොට තැබීම ඉතාමත් වැදගත්ය.

(බෝග වාර්තා පොත භාගතකර ගැනීමට - https://www.slgap.doa.gov.lk/pdf/SLGAP))

- බෝග සැලැස්ම - ඉදිරි  වසරක කාලයක් සඳහා නිවැරදිව සැකසූ බෝග සැලැස්මක් ගොවිපළ සඳහා සකස් කිරීම.
- අදාල වාර්තා විධිමත්ව නඩත්තු කර යාවත්කාලීන කර තිබීම.
- වාර්තා පහසුවෙන් කියවිය හැකි පරිදි පවත්වාගෙන යා යුතු වන අතර කලින් කලට විගණනයට/පරීක්ෂාවට ඉදිරිපත් කිරීම.

### 8. සේවක සෞඛ්‍යය, ආරක්ෂාව හා සුබසාධනය



- හැකි සෑම විටම සේවකයන්ගේ ආරක්ෂාව, සෞඛ්‍ය හා සුභසාධන පහසුකම් සැලසීමට කටයුතු සිදු කිරීම යහපත් කෘෂි පිළිවෙත් යටතේ එන ප්‍රධාන අංගයකි
- සේවකයින් සඳහා ආරක්ෂිත ඇඳුම් පැලඳුම් ලබාදීමත් ශ්‍රමිකයින් සඳහා වැසිකිළි හා අත් සේදීමේ පහසුකම් සපයා ගැනීමට අවස්ථාව සැලසීම


- ගොවිපල හිමිකරුවන් හා සේවකයින්ගේ විවිධ කාර්යයන්ට අදාලව යහපත් කෘෂිකාර්මික පිළිවෙත් වලට සම්බන්ධ වගකීම් පිළිබඳව පුහුණු වරින් වර ලබාදිය යුතු අතර ඊට අදාලව වාර්තා තබා ගැනීම
- හදිසි අවස්ථාවක දී ප්‍රතිකාර කළ හැකි පරිදි ප්‍රථමාධාර පෙට්ටියක් ගොවිපල තුළ හෝ ආසන්නයේ ලඟාවීමට පහසු නිශ්චිත ස්ථානයක් තැබීම කළ යුතුය.
- සියලුම රැකියා තත්ත්වයන් ජාතික මට්ටමේ හෝ ප්‍රාදේශීය නීති රීතිවලට අනුකූලවීම වැදගත් වේ.
- ගොවිපල සේවකයින් සඳහා අවශ්‍ය අවස්ථාවලදී වෛද්‍ය පරීක්ෂණ පහසුකම් ලබාගැනීමට යොමු කිරීමට කටයුතු කළ යුතු වේ.

## 9. පරිසරය හා ජෛව විවිධත්ව සංරක්ෂණය



- ගොවිපොළ ක්‍රියාකාරකම් පාරිසරික නීති රීති වලට යටත්ව සිදුකිරීම.
- වනජීවී හා ජෛව විවිධත්ව සංරක්ෂණ අවශ්‍යතා වලට අනුකූලව කටයුතු කිරීම.
- ස්වභාවික ජල පහරවල් ඇති ස්ථාන වල වගා කටයුතු කිරීමේදී සංරක්ෂණ ප්‍රදේශ වෙන්කර වගා කටයුතු සිදු කිරීම.

## 10. නීතිමය අවශ්‍යතාවය




- සියලු ගොවිපළ කටයුතු හා නිෂ්පාදන සෑම අතින්ම ශ්‍රී ලංකාව තුළ දැනට බල පැවැත්වෙන නීති පද්ධතියේ අවශ්‍යතාවයන් සමග අනුකූල වී තිබිය යුතුය.

## SL-GAP සහතිකකරණය ලබාගැනීම සඳහා අනුගමනය කළ යුතු පියවර

1) ගොවිපළ ක්ෂේත්‍ර තෝරා ගැනීම හා SL-GAP ප්‍රමිතියට අනුව ගොවිපළ සැකසීම- ගොවිපළ සකස්කිරීම සඳහා ප්‍රදේශයේ කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරීන්ගේ සහය ලබාගත හැකිය

2) SL-GAP සහතිකකරණය ලබාගැනීම සඳහා අයදුම්පත්‍රය නිවැරදිව පුරවා අදාළ ඇමුණුම් ද සහිතව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ආසන්නම බීජ සහතික කිරීමේ සේවයේ ප්‍රාදේශිය කාර්යාලය වෙත භාරදීම

**තවදුර විස්තර සඳහා:**

**කෙසෙල් වගාව සඳහා ශ්‍රී ලංකා යහපත් කෘෂිකාර්මික පිළිවෙත් සංග්‍රහය බලන්න**

**භාගතකර ගැනීම සඳහා පහත ලින්ක් එක හෝ QR කේතය**
https://www.slgap.doa.gov.lk/pdf/GAPCodeofPracticesforBananaCultivation.pdf

**විමසීම**

SL- GAP සහතිකකරණ අංශය, බීජ සහතිකකිරීමේ සේවය, ගන්නෝරුව
දුරකථනය - 0812388414
විද්‍යුත් තැපැල (Email) - slgapcertification@gmail.com

In line with vision of
the Government of Sri Lanka

An initiative of the Department of Agriculture

With support from UNIDO under the BESPA-FOOD Project funded by the Delegation of the European Union to Sri Lanka

UNITED NATIONS
INDUSTRIAL DEVELOPMENT ORGANIZATION

Funded by
the European Union